1A - G 34337 — 28 (2021/05)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2227/4 - 2021 මැයි මස 10 වැනි සඳුදා - 2021.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ නියමයන් ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද, අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* පළ කරනු ලැබ ඇති උපලේඛනයේ I කොටසේ, අංක 9 යටතේ පවතින විධිවිධාන පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. මෙම සංශෝධන 2021.04.27 දින සිට බලාත්මක වේ.

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන*<br>*රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 9. ඒකාබද්ධ සේවාවන්ට අයත්, අංකඃ 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීක මට්ටමේ නිලධරයන්, | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් | අංක (I) හා (III) කරුණු නොවෙනස්ව පවතී.<br>(II) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම |
| | අදාළ අමාත්‍යාංශ ලේකම් හෝ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුව අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් යටතේ ඇති ප්‍රාදේශීය කාර්යාලවල හෝ ආයතනවල සේවයේ යෙදෙන නිලධාරීන් (දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති නිලධාරීන්ද ඇතුළුව) එම කාර්යාල අතර ස්ථාන මාරු කිරීම |
| | අදාළ දිස්ත්‍රික් ලේකම් | (I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුව දිස්ත්‍රික්කයක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර නිලධාරීන් ස්ථාන මාරු කිරීම |

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* සඳහන් අනෙකුත් කරුණු සහ ඒ සඳහා විටින් විට කර ඇති සංශෝධනයන් නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එම්.ඒ.බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 මැයි මස 06 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 425

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.